චක්‍රලේඛ අංකය - 20/2014.......

2014.06.06

සියළුම බන්ධනාගාර අධිකාරී / සහකාර අධිකාරී.

<u>අධිකරණ වලදී සැකකරුවන්ට විශේෂ සැලකිලි දැක්වීම.</u>

ඔබගේ බන්ධනාගාරය විසින් සිදුකරනු ලබන ආරක්ෂණ වලදී විශේෂයෙන්ම අධිකරණ ආරක්ෂණ වලදී නියමිත දින අධිකරණයට ඉදිරිපත් කරන සැකකරුවන්, එදින එම සැකකරුවන් විනිශ්චයකාරතුමාට ඉදිරිපත් කිරීමට පෙර හා පසු අධිකරණයේ ඇති සිර මැදිරි වල රැඳවියයුතුය. නමුත් සමහර සැකකරුවන්ට මෙම නීතිමය තත්වය නොසලකා සිරමැදිරියෙන් පිටතට ගැනීම, ඥාතීන්ට පෙන්වීම, දුරකථන මගින් කථා කිරීමට ඉඩදීම, වෙනත් පුද්ගලයින් සමඟ සබඳතා පැවැත්වීමට ඉඩදීම, නීතිවිරෝධී ද්‍රව්‍ය ලබාදීමට කටයුතු කිරීම වැනි සිදුවීම් සිදුවන බව ගරු විනිශ්චකාරතුමන්ලා විසින් මාවෙත දන්වා ඇත.

එබැවින් ආරක්ෂණයේ යෙදී සිටින සියළුම නිළධාරීන් ඉහත සඳහන් ක්‍රියාවන්ගෙන් වැලකී කටයුතු කරන ලෙසට දැනුවත් කරන මෙන්ද එසේ වැරදි ක්‍රියාවන් සිදුකරන නිළධාරීන්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ “අ” උපලේඛනය අනුව උපරිම දඬුවම් ලබාදෙන බව දන්වමි.

මෙම චක්‍රලේඛය ලැබුනු බව දන්වන්න.

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්